# ගැමි ජනයා අතර බුදුදහම ව්‍යාප්ත කිරීමෙහිලා 'දහම් ගැට' කවියේ දායකත්වය

පිටතලාවේ විමලසාර හිමි[1]

## හැඳින්වීම

සිංහල චූල සාම්ප්‍රදායික නිර්මාණ අතර ජනකවියට හිමි වන්නේ ප්‍රධාන ස්ථානයකි. ගැමි ජනයාගේ ජීවන දෘෂ්ටිය, සිතුම් පැතුම්, ජීවන ගැටලු, ආධ්‍යාත්මික සහ භෞතික විපර්යාස, සමාජ සම්බන්ධතා, සිරිත් විරිත් ආදිය වස්තු විෂය කරගනිමින් ජන කවි රචනා වී ඇත. ඒ අතර බුදුදහමේ ගැඹුරු කරුණු සරල භාෂා මාධ්‍යයක් ඔස්සේ ප්‍රහේලිකා හා ගැටලු ස්වරූපයෙන් ඉදිරිපත් වූ දහම් ගැට පද්‍ය සුවිශේෂී වේ. මතුපිටින් ශෘංගාරයක් හෝ හාස්‍යයක් මතු කළද බුදුදහමේ ගැඹුරු කරුණු කාරණා වක්‍රෝක්තිය මූලික කරගනිමින් ප්‍රකාශ වන නිර්මාණ විශේෂයක් ලෙස දහම් ගැට පද්‍ය බහු සම්භාවනාවට පාත්‍ර වේ. මෙම පර්යේෂණයේදී අවධානය යොමු කරන්නේ දහම් ගැට පද්‍ය බුදුදහමේ ව්‍යාප්තිය, බුදුදහමේ ප්‍රචාරයට කවරාකාරයේ දායකත්වයක් දැක්වේද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීමයි.

## පර්යේෂණ ක්‍රමවේදය

සාහිත්‍ය මූලාශ්‍රය මත පදනම්ව සහ පාඨකයාට තෝරාගත් දහම් ගැට පද්‍ය කිහිපයක් ඉදිරිපත් කර ඒ පිළිබඳ ඔවුන්ගේ අවබෝධය පරීක්ෂා කරමින් මෙම පර්යේෂණය සිදුකෙරේ.

## දත්ත විශ්ලේෂණය

ගද්‍ය රචනයට භාෂා නිපුණත්වය, කෘතහස්තභාවය, ප්‍රතිභාව ආදි කරුණු බලපෑව ද පද්‍යයට එය ඒ ආකාරයෙන්ම අදාළ නොවේ. එබැවින් ගද්‍යයට වඩා ගැමියාට සමීප වන්නේ පද්‍යයයි. ගැමියාගේ සිතට නැගුණු දුක, සන්තාපය වැනි කරුණු කාරණා ඉදිරිපත් වූයේ පද්‍යයෙනි. විදග්ධ, බහුශ්‍රැත පුද්ගලයන්ගේ නිර්මාණ ලිඛිත සාහිත්‍යයෙන් එළිදකින විට ගැමියන්ගේ අදහස්, සිතුම් පැතුම් ඉදිරිපත් වූයේ අලිඛිතවය. ජනකවි නමින් හැඳින්වෙන්නේ එම පද්‍ය සම්ප්‍රදයයි. ජනකවිය විදග්ධ භාෂා රීති, උසස් කාව්‍යාලංකාරවලින් තොරව සරල භාෂා රීතියකින් නිර්මාණය වී තිබේ. පැල් කවි, පතල් කවි, නෙළුම් කවි, කරත්ත කවි වශයෙන් ප්‍රභේදගත වන ජනකවියෙහි එක් උපාංගයක් ලෙස තේරවිලි කවියට ප්‍රධාන ස්ථානයක් හිමි වේ. දහම් ගැට තෝරා දිය යුතු අර්ථය, සැඟවුණු කියමන, වාක්‍යය හෝ කවිය නමින් අන්වර්ථිතය. ජනකවියේ අනුෂංගයක් වුව ද ජනකවිය හා දහම් ගැට එකිනෙකට වෙනස් ලක්ෂණ දරයි. ජනකවියේ පවතිනේනේ කිසියම් අදහසක්, සංකල්පයක් හෝ පද්‍යයට නැගීමක් වුවද තේරවිලි කවියෙහි පවතින්නේ ප්‍රහේලිකාත්මක කාව්‍ය සිතුවිල්ලකි.

---

1 සහාය කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
wimsarap@gmail.com

BHIKSHU UNIVERSITY OF SRI LANKA
07 APR 2015

පාඨකයාට විනෝදස්වාදයෙන් ධර්මාවබෝධයක් ලබාදීමට දැරූ ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස දහම් ගැට බිහි විය. ධර්මාවබෝධය මෙහි ප්‍රධාන ධාරණාව වුවද ශ්ලේෂාත්මක බස් වහර හේතුවෙන් පාඨකයාට ශෘංගාරය, හාස්‍යය, උපහාසය ආදි රස විඳිය කළ හැකි අතර චමත්කාරය ඔස්සේ පටිච්ච සමුප්පාදය, චතුරාර්ය සත්‍යය, ත්‍රිලක්ෂණය වැනි ගැඹුරු සංකල්ප සරලව පාඨකයාට ග්‍රහණය කරවයි. ශ්ලේෂාර්ථවත් බස් වහර හේතුවෙන් උගත් - නූගත් දෙපාර්ශ්වය විභේදනයකින් තොරව දහම් ගැට රස විඳීමට අවස්ථාව සැලසේ. දහම් ගැට කවියෙහි පවතින සුවිශේෂිත්වය හේතුවෙන් මෙම ශෛලිය පද්‍ය කෘති රචනයට පවා යොදගත් බව 'දහම් ගැට' සහ 'දහම් ගැට මාලාව' වැනි කෘතිවලින් පැහැදිලි වේ. දහම් ගැටවල අන්තර්ගත කරුණු අනුව කොටස් කිහිපයකට විභේදනය කළ හැකිය.

## බුද්ධ ධර්මයේ ඉගැන්වෙන ගැඹුරු කරුණු අන්තර්ගත දහම් ගැට

දහම් ගැට පද්‍ය නිර්මාපකයෝ බුදුදහමෙහි එන ගැඹුරු සංකල්පනා ඉතා සරලව විනෝදස්වාදනීය ලෙස පාඨකයාට ඉදිරිපත් කළහ. බුදුදහමේ මූලික හරය ඇතුළත් ඉගැන්වීමකි; පටිච්ච සමුප්පාදය. පටිච්ච සමුප්පාදය පිළිබඳ අනවබෝධය හේතුවෙන් සත්ත්වයා සංසාරයෙහි නිරතුරුව ගමන් කරයි. සත්තවයාට පටිච්ච සමුප්පාදය පිළිබඳ අවබෝධය සංසාරයෙන් මිදීමට හේතු වේ. මෙම ගැඹුරු දහම පිළිබඳ සරල ඉගැන්වීමක් කරන පහත කවිය දහම් ගැට කවියාගේ ධී ශක්තිය විදහා පාන කදිම අවස්ථාවකි.

"අඳුරෙකි දූරෙකි විලසෙකි නොසෙකි නික්මෙන
ඇල්ලෙකි දෙළෙකි කඳුරෙකි කොමළ ළඳුනෙන
මොනරෙකි පිළෙකි නැටුමෙකි බඳෙකි අඬලන
කුකුළෙකි මලෙකි පුස්පෙකි සුවඳ විහිදෙන"

මෙහිදී පටිච්ච සමුප්පාදයේ සියලු අංග සංකේතාත්මකව දක්වා තිබේ.

| වස්තුව | රූපකය |
|---|---|
| අවිද්‍යා | අඳුරකි |
| සංස්කාර | දූරකි |
| විඥ්ඥාණය | විලකි |
| නාම, රූප | සතුටකි |
| සළායතන | නික්මීමකි |
| ස්පර්ශ | අල්ලසකි |
| වේදනා | දෙළකි |
| තණ්හා | කඳුරකි |
| උපාදන | කොමල ළඳකි |
| භව | මොනරකි |
| ජාති | නැටුමකි |
| මරණ | බඳෙකි |

| | |
|---|---|
| ජරා | පිළෙකි |
| සෝක, පරිදේව | අඬලෑමකි |
| දුක | කුකුළෙකි |
| දෙම්නස | මලකි |
| උපායාස | මල්පෙත්තකි |

බුදුදහමේ ඉගැන්වෙන ප්‍රධාන ඉගැන්වීම් අතර ත්‍රිලක්ෂණය ප්‍රමුඛ වේ. පහත දැක්වෙන්නේ ත්‍රිලක්ෂණය පිළිබඳ ජනකවියා සරලව ඉදිරිපත් කරන අවස්ථාවකි.

"උදය ගමන් යන්නේ සතර පයෙකිනි
මැදය ඉර මුදුන යන්නේ දෙපයෙකිනි
විඳය සැපත අවරට ගිය තෙපයෙකිනි
සොඳය මෙ පද තේරුවොත් නුවණෙකිනි "

මෙම පද්‍යයේ මතුපිටින් පැනෙන්නේ ඉතා හාස්‍යෝත්පාදක සංකල්පයකි. පළමුව වින්දනයක් ලබා දී පසුව ගැඹුරු කියවීමකට පාඨයාව යොමුකිරීම කතුවරයාගේ අදහස වූයේය. බුදුදහමට අනුව මෙලොව පවතින ජීව-අජීව සැම වස්තුවකම උප්පාද, ඨිති, භංග වශයෙන් පවතින්නාවූ ලක්ෂණ තුනකි. මෙම සංකල්පය හාස්‍යෝත්පාදජනක අයුරින් කවියා ඉහත පද්‍ය මඟින් දක්වයි. මෙලොව එළිය දකින ළදරුවෝ කුඩා කල ඇවිදින්නේ දෙපා සහ දෑත් උපයෝගී කරගනිමිනි. ජවයෙන් සහ උද්‍යෝගයෙන් පිරි යෞවන කාලයෙහි දෙපයෙන් ඇවිදිති. අවසාන කාලයෙහි කුදු ගැසී වෙව්ලන ශරීරය ඍජුව පවත්වා ගැනීමට දෙපා පමණක් වාරු නොවන හෙයින් හැරමිටියක ආධාරයෙන් ඇවිදිති. (පාද තුනඃ දෙපා, හැරමිටිය) පඤ්ච නිත්‍ය වශයෙන් නොපවතින හෙයින් සත්ත්වයා දුකට පත්වේ. නිත්‍ය නොවන, දුකට හේතු වන දේ උපාදන කරගැනීම නිරර්ථක බව මෙමඟින් ගම්‍ය වේ. පහත දැක්වෙන්නේ ඉහත සංකල්පයම ශෘංගාරාත්මකව දැක්වූ අවස්ථාවකි.

"දෙළුම් ගැට රැක්කා
තැඹිලි පොල් වික්කා
පසුව වට්ට ක්කා
වැටකොළු කරල් දැක්කා"

පියයුරු සංකේත වශයෙන් ගෙන මිනිස් ජීවිතයක පවතින අනිත්‍යතාව පිළිබඳ මෙහිදී ජනකවියා දක්වා තිබේ.

**බුදුරජාණන් වහන්සේගේ ස්වභාවය පිළිබඳ කියවෙන දහම් ගැට**

ධර්මය පමණක් නොව එවැනි ශ්‍රේෂ්ඨ දහමක් ලොවට ඉදිරිපත් කළ බුදුරජාණන් වහන්සේගේ උදාරත්වය විදහාපාන පද්‍ය නිර්මාණ ද ජනකවියා අතින් නිර්මාණය වී තිබේ.

"බෝගහ යටදී තණ පොඩි කළ ජිනරතන"

ශෘංගාරාත්මක ස්වරූපයක් සහිතව නිර්මාණය කර ඇති ඉහත පද්‍ය තුළදී සියලු කෙලෙස් ප්‍රහීන කර බෝධි මූලයේදී බෝධිසත්වයන් බුද්ධත්වයට පත් වූ බව නිරූපණය කෙරේ. පහත දැක්වෙන්නේ සිද්ධාර්ථ ගෞතමයන් මෙලොව එළිය දුටු මොහොතේ ග්‍රහ පිහිටීම පැවති ආකාරය නිරූපණය කරන දහම් ගැටයකි.

"ගුරුහාමි ඇද වැටුණයි කකුළු වළේ
හඳහාමි බඩු කිරුවයි වෙළඳ සැළේ
රතුහාමි හත කියමින් මෝර වළේ
කළුහාමි නොන්ඩි ඇන ඇන වැටුණි කළේ "

"මනමාලයා මාලු ගොඩකට යටවෙච්චි
සොම්පුත් එද එළුගාලට අසුවෙච්චි
වන මැද ගොසින් දෙව් බඹු මුණ ගැස්සිච්චි
මෙවැනි දක ඉපදුණි බුදු අප්පොච්චි "

ගුරු-කටක රාශියෙහිද, සඳු-තුලා රාශියෙහිද, කුජ-මකර රාශියෙහිද, සනි-කුම්භ රාශියෙහිද, සිකුරු-මීන රාශියෙහිද, බුදහු-මේෂ රාශියෙහිද පිහිටි බව දක්වා ඇත්තේ හාස්‍යෝත්පාදක අන්දමිනි.

**ජීවිතයේ යථා ස්වරූපය පිළිබඳ කියවෙන දහම් ගැට**

ධර්මය අනුගමනය කිරීම හේතුව, බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨතවය ඇදහීමට හේතුව පොදුජනයාට පැහැදිලි කරදීම පිණිස මිනිස් ජීවිතයේ පවතින නිසරු බව, හිස් බව දක්මවින් ජීවිතයේ යථාර්ථය ඉදිරිපත් කිරීමට ද දහම් ගැට යොදගත්තේය.


"තුන්සීයයක් ලී දඬුපත් සදන් දූයි
නවසියයක් වැල් බානෙන් සදන් දූයි
වළාකුළක් ගෙන ඒ බව සදන් දූයි
අඩුතුන්කෙළක් කෙළ සිදුරෙන් වසන් දූයි"

මෙහි මතුපිටින් ඉදිරිපත් වන්නේ ගෘහ නිර්මාණයක් පිළිබඳ වුවත් අභ්‍යන්තර අදහස එයට වඩා ගැඹුරුය. මිනිස් ශරීරය අස්ථි තුන්සියයකින් ද නහර නවසියයකින් ද නිර්මාණය වී ඇති අතර එය සමෙන් ආවරණය වී තිබේ. සමෙහි රෝප කූප පනස් ලක්ෂයක් සහිත වේ. මිනිස් ශරීරය ලෙස මෙය හැඳින්වුවද එය නිතර ජරාවට, ව්‍යාධියට පත්වේ. මෙම ශරීරයේ ස්වභාවය අවබෝධ කරගෙන ධර්ම මාර්ගයට පිවිසෙන ලෙස කවියා පාඨකයාගෙන් ඉල්ලා සිටී.

මෙම ප්‍රස්තුතවලට අමතරව දහම් ගැට කවියා විවිධ අරමුණු සාධනය කරගැනීම උදෙසා දහම් ගැට නිර්මාණය කළේය. ඒ අතර

- කුසල්-අකුසල්හි විපාක පැහැදිලි කිරීම
- ත්‍රිවිධ රත්නයේ ගුණ ඉදිරිපත් කිරීම
- බියකරු සසරින් එතෙර විය යුතු බව ඒත්තු ගැන්වීම
- ශීලයෙහි ආනිශංස ඉදිරිපත් කිරීම

වැනි කරුණු කාරණා ප්‍රධාන වේ. පහත දැක්වෙන්නේ දහම් ගැට කවිය පිළිබඳ නූතන පාඨකයන් ඇසුරින් සිදුකරන ලද සමීක්ෂණයේ ප්‍රතිඵල සටහනයි.




**සමාලෝචනය**

මිනිසාගේ රුචිකත්වය විවිධාකාර වේ. ඇස, කණ, දිව, නාසය, ශරීරය යන පංචේන්ද්‍රියන්ගෙන් අරමුණු ග්‍රහණය කරගන්නේ රුචිකත්වය පදනම් කරගනිමිනි. පොළොන්නරු යුගයේදී සිංහල ගද්‍ය සාහිත්‍යය ආරම්භ විය. ආමාවතුරින් ආරම්භ වූ ගද්‍ය සාහිත්‍යය පොදු ජනයා තුළ බුදුදහම ව්‍යාප්ත කිරීමට ප්‍රබල දායකත්වයක් සැපයීය. සියබස්ලකර කාව්‍යානුශාසනය හේතුවෙන් පද්‍ය සාහිත්‍යයද ජාතක කථා මත පදනම්ව නිර්මාණය විය. මෙවැනි සාහිත්‍ය පසුබිමක් තුළ සාමාන්‍ය ගැමි ජනයාට බුදුදහමෙහි එන ගැඹුරු සංකල්පනා සරලව පැහැදිලි කිරීමට ජනකවියා අනුගමනය කළ නව උපාය මාර්ගයක ප්‍රතිඵලයක් ලෙස දහම් ගැට කවිය හැඳින්විය හැකිය. ජනකවියේ ප්‍රභේදයක් ලෙස වර්ධනය වූ දහම් ගැට පද්‍ය තුළින් විනෝදාත්මකව දහම් කරුණු ඉදිරිපත් කිරීම හේතුවෙන් ගැමියාට අපූර්වත්වයකින් යුක්තව ධර්මාවබෝධයක් ලබාගැනීම අවස්ථාව සැලසිණ. එය ඔවුන් අතර බුදුදහමෙහි ව්‍යාප්තියට මහත් පිටුබලයක් විය. නූතනයේ පවා පොදු ජනයා අතර දහම් ගැට කවි ජනප්‍රිය වී ඇත්තේ එම ක්‍රමයේ පවතින අපූර්වත්වය හේතුවෙනි.

**ප්‍රමුඛ පද :** චූල සම්ප්‍රදය, ජනකවිය, දහම් ගැට, ධර්ම ප්‍රචාරය

**අශ්‍රේය ග්‍රන්ථ**

*දහම් ගැට.* (සංස්.)(1958). ගන්දර පී.ඩී., ඇස්. වීරසූරිය. කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*දහම් ගැට මාලා විවරණය.* සඳදස් කෝපරහේවා. කොළඹ : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

වීරසූරිය, පී.ඩී.එස්. (1993). *ජන කවි සාහිත්‍යය,* බත්තරමුල්ල: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

ගමගේ, ජේ. නිමල්, සිංහල ජනකවියේ සාහිත්‍යමය අගය හා සංස්කෘතික ලක්ෂණ, වැලිගම: සත්මිණ යන්ත්‍රාලය, 1986.